## 49 – සමිඳුනි ඔබෙ පෙම්

සමිඳුනි ඔබෙ පෙම් කරුණා පා - ඔබෙ නෙත් අප වෙත යොමු කරලා
අසරණ අපහට සරණ වෙලා - සැම තපුරෙන් ගැලවීම දෙවා

ස්වාමිනී මාගේ හද පත්ලෙන් ඔබට මොර ගසමි
ස්වාමිනී ඔබ අපගේ අයහපත් කම් ගණින් ගත්තා
සේක් නම් කා හට ජීවත් විය හැකිද

මම ස්වාමින් වහන්සේ කෙරෙහි
බලාපොරොත්තුවෙන් සිටිමි උන්වහන්සේගේ
වචනය මම විශ්වාස කරමි

මක්නිසාදයත් ස්වාමින් වහන්සේ කෙරෙහි
අනුකම්පාව ඇත්තේය උන්වහන්සේ තුළ
ගැලවීමේ සම්පූර්ණත්වය ඇත්තේය

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට
දැනුත් නිරතුරු ප්‍රශංසා වේවා